# සක් දෙව් රජුගේ හා විශ්මකර්මගේ ඉතිහාසය

ශක්‍රයාගේ පුතා වයිමා යනුවෙන් හඳුන්වන්නේ කවුද යන්න විමසා බැලීමක් පසු ගිය දා ඉරිදා ලක්බිමක පළ වී තිබුණා. ඒ විමසා බැලීම පුරාණ කථා හා මිත්‍යා කථා ආශ්‍රයෙන් කෙරුණ එකක්.

ඒත් ශක්‍රයා ගැනත් ඔහුගේ රාජ්‍ය ගැනත් ඇත්ත ඉතිහාසයට සම්බන්ධ කරලා සොයා බැලීමක් කළ යුතුයි කියලා මං නම් හිතන්නේ.

ග්‍රීක පුරාණ කතා හා මිත්‍යා කථා ගැන ඇත්ත ඉතිහාසය තුළින් සොයා බැලීම් කරලා අර්ථ දක්වීම් දෙන්නට පුළුවන් වෙලා තියෙනව. ඒත් බුද්ධ චරිතයේ හා බුද්ධ සාහිත්‍යයේ එන විවිධ කථාවලට යථාවාදී පදනමක් ඇත්ද කියලා හොයල බලන්න එතරම් උනන්දුවක් නොමැති වීම කණගාටුවක්.

මේ ගැන උත්සාහයක් ඇස්.ඩී. ද ලැනරෝල් මහතා කළ බව මං දන්නවා. ඒත් උන්නැහේගේ උත්සාහය ඊට වඩා ඉදිරියට ගිය බවක් මට නම් පෙනෙන්නේ නෑ.

බුදු බණ කථාවල එන ශක්‍රයා ගැන හොයන්න එදා ඉතිහාසයේ ඇත්ත පරිසරයට බහින්න වෙනව. සිද්ධාර්ථ උපන්නේ ක්‍රි.පූ. 563 වන අතර බුදුන් පිරිනිවන් පෑවේ 483 දී බවයි සඳහන් වෙන්නේ.

මේ වෙන කොට ලෝකයේ ලොකුම ශිෂ්ඨාචාරය වුණේ පර්සියානු අධිරාජ්‍යයයි. ඒ වෙන කොට එහි රජ කළේ මහා ඩෙරියස් රජතුමයි. ඔහු ක්‍රි.පූ. 549 දී උපත ලබා ක්‍රි.පූ. 486 දක්වා රජ කළා. ඔහුගේ අධිරාජ්‍යය මිසරයේ සිට ඉංදියාවේ තක්සිලාව දක්වා පැතිර තිබුණා.

ගෝර්ඩන් චයිල්ඩ් (Gordon Child) අපට මෙහෙම කියා දෙනව.
"By 500 BC the empire of Darius extended from the Nile and the Aegean to the Indus and the Jaxartes."

ඔහුගේ හමුදාව තුළ ඉංදියානු අශ්වාරෝහක රෙජිමේන්තුවක් සිටි බවක් එතුමන් අපට පෙන්වලා දෙනව.

මෙම අධිරාජ්‍ය තුළ ඉතා හොඳින් තැපැල් හුවමාරුව, ගමන්බිමන් පහසුව තිබුණ බවත්, ආරක්ෂිත වූ පාරවල්වලින් පෙරේස්පොලිස් නම් වූ අග නගරයට සෑම පෙදෙසක්ම සම්බන්ධ වූ බවත් Carleton S. Coon තම "මිනිසාගේ ඉතිහාසය" පොතේ සඳහන් කරනව. ඔහු මෙහෙම කියනව.
"The empire was divided in to provinces, called Satrapies, which numbered a maxim of thirty one. Special roads linked their capitals. Garrisons guarded these high ways, on which both the postal and other travelers equipped with official documents could make use of the post horse services."

මේ තරම් අදහස් හුවමාරුව හා ගමන් පහසුව සලසා තිබුණ තත්වයක් තුළ ඉංදියාවේ බුදුන්ගේ ක්‍රියාමාර්ග ගැන ඩෙරියස් රජු නොදන හිටියා හෝ බුදුන් ඩෙරියස් හමු නොවී සිටියා වන්නට බෑ.

ඒ කාලය වන විටත් මිනිසා එකම වර්ගයක් යන අදහස ස්ථිර වී තිබුනේ නෑ. එය නිර්මල ලෙස ඉදිරිපත් කළ පළමු දාර්ශනිකයා තමයි බුදුන්.

ඒ වන විට ආර්යයන් එකම වර්ගයක් ලෙස සැලකුවත්, ඔවුන්ද දර්ශනය අනුව බෙදී සිටියා. ඒ වන විට බහු බලයන් ඇදහූ තත්වයේ සිට එක් ප්‍රධාන විශ්ව බලයක් ගැන අදහසට ළං වෙමින් සිටියත් මේ ප්‍රධාන විශ්ව බලය ඒකීයද, නැත්නම් ද්විත්වද යන්න උඩ බෙදීමක් ආර්යයන් අතර තිබුණා.

එකම යන අදහස ඇදහූ අය මොනෝ (Mono) හෙවත් මිනිස් ලෙසටත්, හොඳ - නරක ලෙස ප්‍රධාන විශ්ව බලය ද්විත්ව ස්වරූපයක් ගන්නා බව ඇදහූ අය දේව (Diva, Divine) ලෙසත් වෙන්වීම ආර්යයන් අතරම සිදු වූ දෙයක්.

මේ අනුව පර්සියාව පාලනය කළ අය දේව කොටසට අයත් වුණා. ඔවුන්ගේ දාර්ශනිකයෙකු වූ සරතුෂ්ට්‍ර ද්විත්වවාදියෙක්. ඔහු ජීවත් වුනේ බුදුන්ට ටික කලකට පෙර (628-551 BC).

බුදුන් බිහිවන විට ඉංදියානු දර්ශනය මිනිස් ලෙස හැඳින් වූ ඒකීය බ්‍රහ්මවාදයක්. මේ අනුව බැළුවහම පර්සියාවේ පාලක ආර්යයන් දෙවියන් ලෙස හැඳින් වූ බව අපට පිළිගන්නට වෙනවා.

ඒ ලෙසටම ඉංදු ආර්යයන් මිනිස් ලෙසට හැඳින් වූ බවයි අපට පිළිගන්නට වෙන්නේ. එදා වන විට ග්‍රීසියේ පදිංචිව සිටියෙත් මිනිස් යන කොටසට අයත් ආර්යයන්ගෙන් පැවැත එන අයයි. ඔවුන්ගේ ඇදහීමේ විශ්ව බලයන් අතර සියුස් (Zeus) ප්‍රධානියා වුණා. එතැන ද්විත්වවාදයක් නෑ.

ඩෙරියස් රජුට ආර්ය චක්‍රවර්තී යන නමක් හා දෙදෙව් ලොවට අධිපති නමින්ද හැඳින් වූ බවක් ඉතිහාසයම පෙන්වා දෙනව. එසේම ඔහුට ශක්තිමත් දහසක් ඉක්මවූ වරපුරුෂ සේවයක් තිබුණ නිසා දහසක් ඇස් ඇත්තා ලෙසත් හඳුන්වා තිබෙනව.

මේ සියල්ලෙන්ම ඔප්පු වෙන්නේ පර්සියාවේ දේව ආර්ය වර්ගයාගේ මහ රජු වූ ඩෙරියස් ශක්‍රයා ලෙස බුදුන්ගේ කාලය තුළ පිළිගත් බවයි.

ඊළඟට මේ ඩෙරියස් රජුට ඉතාම දැඩි සිත් ඇති පුතෙක් සිටි බව සඳහන් වෙනව. ලැනරෝල් මහතා සක්සිස් ගැන මෙහෙම කියනව.
"පියා ජීවත්ව සිටියදීම මිසරයෙහි පටන් ගත් කැරැල්ලක් මැඩපැවැත්වීම ඔහුගේ පළමු වන කාර්යය වීය. ඔහු මෙය මැඩපැවැත්වූයේ මහත් දරුණු අන්දමින් හෙයින් පළිගන්නා දිනය පැමිණෙන තෙක් මිසරය පසු වූයේ මහත් බද්ධ වෛරයෙනි. බැබිලෝනියාවෙහිද හටගත් කැරැල්ලක් ඔහු මැඩපැවැත්වූයේ එබඳුම දරුණු අන්දමින්මයි. නගරයෙහි කොටුපවුරු කඩා දමා දේවාල සුණුවිසුනු කොට බෙල් දෙවියාගේ රන් පිළිමය පවා මකවා දැම්මේය."

සක්සිස් ගැන Collins Dictionary of Biography වල සඳහන් වන්නේ මෙහෙම.
"Xerxes I (486-465 BC) succeeded father Darius I, whose war he continued. Defeated Greeks at Thermopylae, razed Athens............"

විශ්ව බලයන් විශ්වාස නොකළ මේ ශක්‍ර පුත්‍රයා තම පියාව පරාජය කළ ග්‍රීක්වරු යටපත් කර ඇතැන්ස් නගරය සමතලා කළ බව මෙයින් පෙනෙනවා. එහෙත් ඔහුගේ මුරණ්ඩුකම නිසාම අවසානයේදී තම හටයින් අතින්ම මරුමුවට පත් වුණා.

මට නම් හිතෙන්නේ මේ සක්සිස්, විශ්වකර්ම හෙවත් වයිමා ලෙස හැඳින් වූවා කියායි. මොකද? තම පියාව මැරතන්වලදි විශ්මය ජනක ලෙස පරාජය කළ ග්‍රීක්වරුන් පවා ආපසු පරාජය කර ඇතැන්ස් නගරය සමතලා කළ මොහුට කළ නොහැකි දෙයක් නැතැයි ග්‍රීක්වරුන් සැලකූ බව පෙනෙනව.

එනිසා ඉතාම සියුම් ලෙස වැඩ කර මොහුව විනාශ කිරීමට ඔවුන් විවිධ ක්‍රියාමාර්ග ගත්තා. කෙසේ වෙතත් ශක්‍රයාගේ පුත් වයිමාගේ වැටීමෙන් දේවවාදය පාලක ආර්යයන් අතින් ඉවත් වුණා.

ඉන් පසු එය රැඳුනේ වහළුන් වූ යුදෙව්වන් අතර පමණයි. මිනිස් ආර්යයන් ලෝකය පුරා පැතිර ගියේ පාලක වර්ගයා ලෙසටයි.

ඒත් බුදුන්, ක්‍රිස්තු වැනි දාර්ශනිකයන් මිනිසා යන්න සැමට පොදු හැඳින්වීමක් ලෙසට සමාජ ගත කළා. ඉන් පසු දේව යන්න මිනිසුන් අතරින් වියෝ වී අද්භූතයක් බවට පත් වුණා.